කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**බාහිර විභාග අංශය**

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2009**
**2010 අගෝස්තු / සැප්තැම්බර්**

**මානවශාස්ත්‍ර පීඨය**

**බෞද්ධ සංස්කෘතිය - BUCU – E 3015**

**බෞද්ධ සංස්කෘතියේ ශ්‍රී ලාංකේය වර්ධනය හා ආසියානු ව්‍යාප්තිය**

**කොටස් දෙකෙන් ම ඇතුළත් වන පරිදි ප්‍රශ්න <u>පහකට (05)</u> පිළිතුරු සපයන්න**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි** **කාලය : පැය 03 යි**

---

## <u>1 කොටස</u>

01. ලක්දිව බුදුසමය ප්‍රතිෂ්ඨාපනය වූ අයුරු කෙටියෙන් දක්වා එහි ව්‍යාප්තිය කෙරෙහි බල පෑ හේතු සාධක පිළිබඳ විමසීමක් කරන්න.

02. දඹදෙණි කතිකාවත තුළින් හෙළිවන තත්කාලීන භික්ෂු සමාජය පිළිබඳ විවරණයක් කරන්න.

03. 18 වන සියවසේ ශ්‍රී ලංකාවේ ජාතික ආගමික පුනරුදය උදෙසා වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ මාහිමියන් ඉටු කළ කාර්යභාරය අගයන්න.

04. පෘතුගීසි පාලන සමය මෙරට දේශීය සංස්කෘතියට ඇති කළ බලපෑම කෙතෙක් ද යන්න පරීක්ෂා කරන්න.

05. පහත සඳහන් මාතෘකා **<u>දෙකකට (02)</u>** ප්‍රමාණවත් සටහන් ලියන්න.
   i. අනුරාධපුර මහාවිහාරය
   ii. දුටුගැමුණු රජතුමා
   iii. උඩරට ගිවිසුම
   iv. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

## <u>11 කොටස</u>

06. බුද්ධ කාලීන ශාසන ව්‍යාප්තියෙහි ලා තුඩුදුන් හේතු සාධක කවරේද යන්න පැහැදිලි කරන්න.

07. බුරුම - ශ්‍රී ලංකා ආගමික සබඳතා දෙරටේ ම බෞද්ධ සංස්කෘතියේ පෝෂණය පිණිස සැපයූ පිටුබලය සමාලෝචනය කරන්න.

08. කණිෂ්ක රාජ්‍ය සමය බෞද්ධ සංස්කෘතික ඉතිහාසයේ සන්ධිස්ථානයක් සනිටුහන් කළ සමයක් ලෙස සැලකීමේ යෝග්‍යතාවය පෙන්වා දෙන්න.

09. ජපන් බෞද්ධ සංස්කෘතියේ නව ප්‍රවණතා ඇති කිරීමට සෙන් බෞද්ධ සම්ප්‍රදාය ඉවහල් වී ඇති අයුරු සනිදර්ශනව පැහැදිලි කරන්න.

10. පහත සඳහන් මාතෘකා <u>දෙකකට (02)</u> ප්‍රමාණවත් සටහන් ලියන්න.

i. නාලන්දා විශ්වවිද්‍යාලය
ii. බෝධානය
iii. බෝරෝබුදූර්
iv. කුමාරජීව හිමි

****************************